# ඊළමට එරෙහි ගෝලීය සන්ධානය

දකුණු දිග පකිස්ථානයේ නිදහස් බලුචිස්ථානයක් සඳහා සටන් වදින බලූච් ගරිල්ලන්ට ඉන්දියානු ඔත්තු සේවා ආධාර කරතැයි පකිස්ථානය කියයි. වයඹ දිග ඉන්දියාවේ කාශ්මීර ගරිල්ලන්ට පකිස්ථාන ඔත්තු සේවා විසින් පුහුණුව සහ ආධාර සපයතැයි ඉන්දියාව කියයි. තිබ්බතය චීනයෙන් වෙන්කොට නිදහස් රාජ්‍යයක් කිරීම සඳහා වන දලායි ලාමාගේ ව්‍යාපාරයට ඉන්දීය ඔත්තු සේවා අනුග්‍රහ දෙතැයි චීනය කියයි. නමුත් මේ සියළු ගැඹුරු පරස්පරතා ඊළම් යුද්ධයේ සන්දර්භය තුළදී අතරමැද සමාදානයකට එළඹෙන බව පෙනේ. ඒ අනුව ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට අවශ්‍ය දැනුම සහ පුහුණුව ඉන්දීය යුද ඇකඩමි මගින් සැපයේ. යුද්ධය සඳහා අවශ්‍ය අවි හා වෙනත් යුද්ධෝපකරණ චීනයේ රාජ්‍ය අවි නිෂ්පාදන සමාගම් විසින් සපයයි. පකිස්ථාන විශේෂ සේවා ඒකකය (SSG) ශ්‍රී ලංකා කොමාන්ඩෝ භටයින්ට සටන් පුහුණුව සපයන අතර කොටි සංවිධානයට එරෙහිව පකිස්ථාන ගුවන් හමුදාවේ සහ මිලිටරි ඔත්තු සේවා කාර්යාංශයේ (DGMI) සහාය ශ්‍රී ලංකා රජයට ලැබේ. ඉන්දියාවේ, පාකිස්ථානයේ හෝ චීනයේ භෞමික අඛණ්ඩතාව කෙරෙහි ඔවුනොවුන් අන්‍යෝන්‍ය වශයෙන් නොදක්වන පිළිගැනීමක් බැලූ බැල්මට ශ්‍රී ලංකාවේ 'භෞමික අඛණ්ඩතාව' වෙනුවෙන් ලබා දී ඇති සෙයක් පෙනේ. ඊළම් යුද්ධය, කලාපීය පිළිමළුන් එකට බැඳ දමන බන්ධන බලයක් සහිත එකක් සේ පෙනෙන්නේ එහෙයිනි.

මේ 'පසමිතුරන්ගේ සන්ධාන' ඉහත කී රාජ්‍යයන්ට සීමා වූවක් පමණක් නොවේ. පසමිතුරු රාජ්‍යයන්ගේ දේශසීමා විනිවිදින ඉන්ද්‍රජාලික බලයක් සිව්වෙනි ඊළම් යුද්ධයට ලැබී තිබේ. ඉරානය සහ ඊශ්‍රායලය තවත් දර්ශීය නිදසුනකි.

### ඊශ්‍රායලය සහ ඉරානයඃ පසමිතුරන්ගේ තවත් අක්ෂයක්

ශ්‍රී ලංකාව සහ ඊශ්‍රායලය අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල ඉතිහාසය ව්‍යාකූලතා ගහණ එකකි. නමුත් තිස් අවුරුද්දක් දිවෙන ඊළම් යුද්ධයේ ඉතිහාසය තුළ ශ්‍රී ලංකා රජයේ උද්‍යෝගීමත් ආධාර කරුවෙකු වශයෙන් ඊශ්‍රායලය කටයුතු කර තිබේ. ඒ සබඳතා වර්ධනය කිරීමෙහිලා පුරෝගාමී මූලාරම්භකයා වූයේ ජයවර්ධනයි. 1970දී සමගි පෙරමුණු ආණ්ඩුව විසින් අත්හැර දමන ලද ඊශ්‍රායල් සබඳතා, 1983න් පසුව වර්ධනය කිරීමට ජයවර්ධන විවෘතවම ක්‍රියා කළේය. ඒ එක්සත් ජනපදයේ නොමඳ ආශිර්වාදය යටතේය. '83 අගෝස්තුවේදී සිදු වූ ජයවර්ධන රජයේ කැබිනට් ලේකම් ජී.වී.පී.සමරසිංහගේ 'හදිසි' ඊශ්‍රායල් සංචාරය එහි වැදගත් සන්ධිස්ථානයකි. 1984 මැයි මාසයේදී දෙරට අතර පළමු ද්විපාර්ශ්වික සම්මුතිය ඇති කර ගැණුනු අතර රේගන්ගේ රිපබ්ලිකන් පාලන තන්ත්‍රයේ 'සංචාරක තානාපතිවරයෙකු' සේ සැළකුණු, කලක් ඇමරිකානු මධ්‍යම ඔත්තු සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරය දැරූ ජෙනරල් වර්නන් ඒ. වෝල්ටර්ස් ඒ සඳහා පහසුකාරකයෙකු වශයෙන් ක්‍රියා කළේය. 1984 මැයි 24 වෙනිදා කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලය තුළම 'ඊශ්‍රායල් සබඳතා ඒකකයක්' ආරම්භ කරන ලද්දේ ඒ එකඟතාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙනි. කුප්‍රකට ඊශ්‍රායල් මොසාඩ් ඔත්තු සේවය සහ 'ෂින් බෙත්' අභ්‍යන්තර ආරක්ෂක ඒකකය ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අංශ සඳහා අවශ්‍ය පුහුණු සහ උපදේශන සපයන්නන් බවට පත්වන්නේ ඒ අනුව ය.

නමුත් කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලය තුළ පවත්වාගෙන යනු ලැබූ ඊශ්‍රායල් සබඳතා ඒකකය 1990දී ජනාධිපති ප්‍රේමදාස විසින් වසා දමනු ලැබීමෙන් එතෙක් පැවැති සමීප රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සැළකිය යුතු දුරකට අඩාල විය. එකී සබඳතා අලුත් වටයකින් ආරම්භ කරන ලද්දේ චන්ද්‍රිකා කුමාරණතුංග පාලනය යටතේ දියත් වූ තුන්වෙනි ඊළම් යුද සමයෙහිය. මුලින් ආවෘත ස්වභාවයක් දැරූ ද්විපාර්ශ්වික සබඳතාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් 1996 සිට 2000 දක්වා සිව් වසරක කාලය තුළ ඊශ්‍රායල් අවි මහා පරිමාණ වශයෙන් ශ්‍රී ලංකාවට සැපයිණ. එම කාලය තුළදී පමණක් කෆීර් ප්‍රහාරක ජෙට් යානා 15ක්ද, නියමුවන් රහිත නිරීක්ෂක යානා 10ක්ද, නෞකා නාශක ගබ්රියෙල් 2 මිසයිල සහ නාවුක ප්‍රහාරක යාත්‍රාවන්ද ඊශ්‍රායලය විසින් ශ්‍රී ලංකාවට සපයන ලදී. *(Stolkholm International Peace Research Institute - Arms Transfers Database)* එහෙත් විවෘත රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තවදුරටත් පමා කෙරුණි. නමුත් 'ජය සිකුරු' හමුදා ක්‍රියාන්විතය ආපසු හරවමින් පරන්තන්-අලිමංකඩ කඳවුරු සංකීර්ණය අල්ලා ගැනීමට කොටි සංවිධානය සමත්වීම විසින් නිර්මාණය කළ වාතාවරණය, විවෘත ඊශ්‍රායල් සබඳතා ඇති කරගැනීමට පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුවට බල කර සිටියේය. ඒ අනුව 2000 මැයි මාසයේදී යළිත් ඊශ්‍රායලය හා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආරම්භ කෙරුණු අතර 2003 වසරේ අග භාගයේ පළ වූ *AP* ප්‍රවෘත්ති සේවයේ වාර්තාවකට අනුව ඉන්දියාව සහ තුර්කිය හැරුණු විට ඊශ්‍රායල් අවි සඳහා වූ ප්‍රධානතම වෙළඳපොළවල් අතරට ඒ වනවිට ශ්‍රී ලංකාවද ඇතුළත්ව තිබිණ. *(Israel's weapons exports skyrocket - Peter Enav / 18 November 2003)*

නමුත් බොහෝ දුරට උපයෝගිතා ආකල්ප මත යළි ගොඩනැගුණු ශ්‍රී ලංකා - ඊශ්‍රායල යුද සබඳතා දේශපාලන තලයකට වර්ධනය කිරීම සිදුවූයේ වත්මන් ආණ්ඩුව යටතේ ය. 2006 මැයි මාසයේදී ටෙල් අවීව් නුවර පැවැති ඇග්‍රිටෙක් 2006 කෘෂිකාර්මික ප්‍රදර්ශනයට සහභාගී වූ ජනාධිපති රාජපක්ෂගේ සොහොයුරු චමල් රාජපක්ෂ, ඊශ්‍රායලයේ සංචාරය කළ පළමු ශ්‍රී ලංකා ඇමතිවරයා වශයෙන් ඉතිහාසගත වූයේ ඒ අනුවය *(http://www.israel.org/MFA)*. සිව් වෙනි ඊළම් යුද්ධය ආරම්භ වී තුන් මාසයක් ඇවෑමෙන් 2006 නොවැම්බර් මාසයේ මුල් සතියේදී කොළඹට ළඟා වූ ඊශ්‍රායල් විදේශ අමාත්‍යාංශ දූත කණ්ඩායම සහ ශ්‍රී ලංකා රජය අතර පැවැති දේශපාලන සාකච්ඡාවන් නව පරිච්ඡේදයක ආරම්භය සළකුණු කරන ලදී. ඊශ්‍රායල් විදේශ අමාත්‍යාංශයේ ආසියා - පැසිෆික් කලාපීය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් නායකත්වය සපයන ලද මෙම විශේෂ නියෝජිත පිරිස, ශ්‍රී ලංකා අගමැතිවරයා මෙන්ම විදේශ අමාත්‍යාංශ නිළධාරීන්ද හමුවී සාකච්ඡා කළහ. *(Israel Ministry of Foreign Affairs Press Release / 06 November 2006)* ඊශ්‍රායල් නියෝජිත පිරිසේ සංචාරය වර්ධනය වන සම්බන්ධතාවන්ට අදාළ ආරම්භයක් විය. 2007 ජූලි 29 වෙනිදා විදේශ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් පාලිත කොහොන සිව් දින නිල චාරිකාවක් අරඹමින් ඊශ්‍රායලයේ චාරිකා කළේය. ඊශ්‍රායල් විදේශ අමාත්‍යාංශ බලධාරීන් මුණ ගැසී සාකච්ඡා කළ ආචාර්ය කොහොන, ඊශ්‍රායල් ජනාධිපති ෂිමෝන් පෙරේස් වෙත යොමුකළ ජනාධිපති රාජපක්ෂගේ විශේෂ සුබ පැතුම් රැගත් සංදේශයක්ද භාරදෙන ලදී. විදේශ ලේකම්වරයාගේ මෙම චාරිකාවේදී 'ත්‍රස්තවාදයෙන් පීඩා විඳි රාජ්‍යයන් දෙකක් වශයෙන් සියළු ආකාරයේ ත්‍රස්තවාදය දෙරට විසින්ම හෙළා දකින ලද බව' අගොස්තු 03 වෙනිදා 'දි අයිලන්ඩ්' පුවත්පත වාර්තා කර තිබිණ.

ආචාර්ය කොහොනගේ චාරිකාවෙන් අට මාසයක් ඇවෑමෙන් 2008 මාර්තු 23 වෙනිදා අගමැති වික්‍රමනායක ටෙල් අවීව්

නුවරට ගොඩ බැස්සේය. 1949 දී ශ්‍රී ලංකාව විසින් නිල වශයෙන් ඊශ්‍රායලය පිළිගනු ලැබීමෙන් පසු ඊශ්‍රායලයේ චාරිකා කළ පළමු ශ්‍රී ලාංකික අගමැතිවරයා වශයෙන් ඔහු ඉතිහාසගත විය. ඔහුගේ මූලිකත්වයෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා දූත කණ්ඩායමට ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගමේ සභාපති ජයන්ත වික්‍රමසිංහද ඇතුළත් විය. (ඊළම් යුද්ධය නිල වශයෙන් ආරම්භ වූ 2006 ජූලි මාසයේදී ස්ථාපනය කරන ලද ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම, ශ්‍රී ලංකා ආරක්‍ෂක හමුදාවන්ට අවශ්‍ය අවි ආයුධ මිලදී ගැනීමේ ඒකාධිකාරයට හිමිකම් කියයි.) අගමැති වික්‍රමනායක හමු වූ ඊශ්‍රායල් අගමැති එහුඩ් ඔල්මර්ට් 'ත්‍රස්තවාදයට කිසිසේත් ඉඩ දෙන්න එපා. එය ඔබේ රටට ගෙන එනු ඇත්තේ විනාශය පමණි. ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරනු විනා ඊට යටත් නොවිය යුතුයැ''යි කී බව මාර්තු 23 වෙනිදා ඊශ්‍රායල් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිකුත් කරන ලද නිවේදනයක දැක්විණ *(www.pmo.gov.il)*. ඊශ්‍රායල් අගමැතිවරයාට අමතරව ආරක්‍ෂක ඇමති එහුඩ් බරාක් මෙන්ම ජනාධිපති ෂිමෝන් පෙරේස්ද හමු වී සාකච්ඡා කළ අගමැති වික්‍රමනායක 26 වෙනිදා ටෙල් අවීව් නගරයෙන් නිකමුණ නමුත් ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගමේ සභාපතිවරයා මාර්තු 28 වෙනිදා තෙක්ම එහි රැඳී සිටි බව කොළඹ ඉංග්‍රීසි පුවත්පත් වාර්තා කළේය. ස්ටොක්හෝම් ජාත්‍යන්තර සාම පර්යේෂණ ආයතන දත්ත සම්පින්ඩණයන්ට අනුව 2005 සිට 2007 දක්වා කාලය තුළ ඇමරිකානු ඩොලර් මිලියන 08ක යුද අවි ඊශ්‍රායලය විසින් ශ්‍රී ලංකාව වෙත සම්පාදනය කර තිබේ.

නමුත් ඊශ්‍රායලය හා ශ්‍රී ලංකාව අතර වර්ධනය වන නව දේශපාලන සහයෝගීතාව, එහි අංක එකේ සතුරා සේ සැළකෙන ඉරානයේ ආධාර ශ්‍රී ලංකා රජයට හා එහි ආරක්‍ෂක හමුදාවන්ට ලැබීමට බාධාවක් වී නොමැත. අනුරාධපුර ගුවන් හමුදා කඳවුරට එල්ල කරන ලද කොටි ගරිල්ලා ප්‍රහාරයෙන් විනාශ වූ පුහුණු සහ නිරීක්‍ෂක යානා අලුතින් මිලදී ගැනීමට රාජපක්‍ෂ රජය ඉරාන ආණ්ඩුවේ මූල්‍යාධාර පැතූ බව ඉන්දීය හිටපු ඔත්තු සේවා ප්‍රධානියෙකු වන බී.රාමන් 2007 නොවැම්බරයේදී අනාවරණය කළේය. *(Iran to Fund Sri Lankan Arms Purchase - International Terrorism Monitor / Paper No. 303/www.southasiaanalysis.org)* ඉන් දින කිහිපයක් ඇතුළත ජනාධිපති රාජපක්‍ෂ ඉරානයේ සංචාරයක යෙදුණු අතර ඔහුගේ ඇරයුමින් 2008 අප්‍රේල් මාසයේදී දෙදින චාරිකාවක් සඳහා ඉරාන ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවට ළඟා විය. ඇමරිකානු ඩොලර් මිලියන 450ක වියදමින් ඉදි කෙරෙන උමා ඔය ජල විදුලි යෝජනා ක්‍රමය සහ ඩොලර් බිලියනයක ඉරාන ආයෝජනයන්ට ඉඩ සැළසෙන සපුගස්කන්ද තෙල් පිරිපහදු සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අමතරව තවත් වැදගත් එකඟතාවන්ට මෙම චාරිකාවන් විසින් දොර හැර තිබේ. අප්‍රේල් 28 වෙනිදා *southasiaanalysis.org* වෙබ් අඩවියට බී.රාමන් විසින් ලියන ලද විශේෂ වාර්තාවකට අනුව ශ්‍රී ලංකාවට අවශ්‍ය යුද අවි චීනයෙන් සහ පකිස්ථානයෙන් මිලදී ගැනීම සඳහා අවශ්‍ය අඩු පොළී ණය ආධාර සැපයීමට ඉරානයේ එකඟතාව පළ වී ඇත. එමෙන්ම ශ්‍රී ලංකා හමුදාවන්ගේ සහ රාජ්‍ය ඔත්තු සේවාවන්ගෙන් තෝරා ගැනෙන සීමිත කණ්ඩායමකට අවශ්‍ය පුහුණු පහසුකම් සැපයීමටද ටෙහෙරාන පාලනය කැමැත්ත ප්‍රකාශ කොට තිබේ. මේ සඳහා අවශ්‍ය පසුබිම සකස්කරනු වස් ඉරානයේ ජෙරුසෙලම් බ්‍රිගේඩයේ අධ්‍යක්‍ෂ ජෙනරාල්වරයා වන බ්‍රිගේඩියර් ජෙනරාල් කාසීම් සුලෙයිමානී අප්‍රකටව ශ්‍රී ලංකා චාරිකාවක යෙදුණු බවද රාමන් විසින් හෙළි කොට තිබිණ. උත්ප්‍රාසය දනවන කරුණක් වන්නේ ඊශ්‍රායලයට එරෙහි ඉරාන රහස් මෙහෙයුම් සම්බන්ධ මූලිකත්වය දරන්නේ ජෙනරාල් සුලෙයිමානීගේ මූලිකත්වයෙන් යුතු මෙකී ජෙරුසෙලම් බ්‍රිගේඩය විසින් වීමයි. *(Iran to Train Sri Lankan Intelligence and Army Officers - Paper No. 2679/www.southasiaanalysis.org)*

සිව්වෙනි ඊළම් යුද්ධය, පසමිතුරු හූ දේශපාලන අභිලාෂයන් සහිත තරඟකාරී බලවේගයන්ට පොදු අරමුණක් සපයා ඇතැයි කීම අතිශයෝක්තියක් නොවන්නේ ඉහතින් කී ව්‍යතිරේඛී කලාපීය යථාර්ථයන් හේතුවෙනි. පකිස්ථානය සහ ඉන්දියාවත්, ඉන්දියාව සහ චීනයත්, ඉරානය සහ ඊශ්‍රායලයත් අතර මුල් බැසගත් පරස්පරතා ඊළම් යුද්ධයේ සන්දර්භය තුළ මැකී යන්නේ මේ අනුවය. ඇත්ත වශයෙන් සළකතොත් දෙමළ ගරිල්ලන් මුහුණ දෙමින් සිටින්නේ හුදෙක් සංඛ්‍යාත්මකව විශාල ශ්‍රී ලංකා හමුදාවන්ගේ ප්‍රහාරක බලයට පමණක් නොවේ. ඔවුහු චීන, ඊශ්‍රායෙල් සහ පකිස්ථාන අවි තාක්‍ෂණයට මෙන්ම ඉන්දීය, පකිස්ථාන සහ ඉරාන විශේෂඥ මිලිටරි දැනුමටත්, මේ සියළු රාජ්‍යයන්ගේ මූල්‍ය ශක්තියටත් එකවර මුහුණ දෙමින් සිටියි. නමුත් යථා ලෙස කල්පනා කරන්නේ නම් මෙකී ලැයිස්තුවද අසම්පූර්ණ එකකි. සිව්වෙනි ඊළම් යුද්ධයේදී ශ්‍රී ලංකා රජයේ සංග්‍රාමික හැකියාවන් වර්ධනය කිරීමෙහි ලා බටහිර රාජ්‍ය පද්ධතිය විසින් සපයනු ලැබ ඇති විශේෂිත ආධාර සහ අනුග්‍රහයන් මඟහැර මෙම යථාර්ථයන් පූර්ණ වශයෙන් වටහා ගත නොහැකිය.

**'යුද විරෝධී බටහිර කුමන්ත්‍රණය' ඇත්තක්ද?**

යුද්ධය අඩාල කිරීමේ බටහිර කුමන්ත්‍රණ පිළිබඳ විශ්වාසය දකුණේ ජන මනස තුළ මුල් බැසගත් එකකි. ඊට හේතු කිහිපයක් බලපාන්නට ඇතැයි අනුමාන වශයෙන් සිතිය හැක. පළමුවැන්න පාලක සන්ධානයේ හවුල්කාර පාර්ශ්වයන් විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන ප්‍රචාරක අවධාරණයන් ය. දෙවැන්න, සන්ධානයේ අභ්‍යන්තර දේශපාලන කොටස්කරුවන් නොවන මුත්, ඉන් භාහිරව හිඳ යුදමය ක්‍රියාමාර්ගයට ආධාර සපයන අවශේෂ දේශපාලන කණ්ඩායම් සහ සංවිධානාත්මක සමාජ බලවේග විසින් කරනු ලබන පුනරුච්ඡාරණයන් ය. තුන් වැන්න, ඉහත කී මතයන් යළි යළිත් ප්‍රතිනිෂ්පාදනය කිරීමට බහුතර ජනමාධ්‍ය දක්වන උනන්දුව ය. මීට අමතරව බැහැරින් දියත්වන කුමන්ත්‍රණ පිළිබඳ දකුණේ ජන මනස තුළ ඓතිහාසිකව ස්ථාපිතව ඇති කොදෙව් භීතියද මෙයට යම් පමණකට දායකව තිබෙන්නට ඉඩ ඇත.

නමුත් යථාර්ථය පිහිටා ඇත්තේ මේ බහුජන විශ්වාසයන්ට ප්‍රතිමුඛවය. රාජ්‍ය පිළිවෙත් යනු කොළඹ තානාපති කාර්යාල විසින් නිකුත් කරන ප්‍රවෘත්ති නිවේදන නොවේ. 'අපිට පක්‍ෂ' සහ 'අපිට එරෙහි' බලවේග වශයෙන් පෙරදිග සහ අපරදිග රටවල් අතර විශාලනය කොට පෙන්වන බෙදුම් ඉර මහා මුසාවක් වන්නේ එබැවිනි. ඇත්ත වන්නේ චීනය හෝ පකිස්ථානයට නොදෙවෙනි තරමින් එක්සත් ජනපදය හෝ බ්‍රිතාන්‍යයද දෙමළ ගරිල්ලන්ට එරෙහිව ශ්‍රී ලංකා රජයේ හස්තය ශක්තිමත් කිරීමට බැරෑරුම් දායකත්වයක් ලබා දී ඇති බවය. ඒ අනුව යථාර්ථය ඊළමට එරෙහි පෙරදිග සන්ධානයක් නොව, ගෝලීය සන්ධානයකි. 'මෙවර ජයගනු බැරි නම් කිසි කලෙකත් ජයගන්නට බැහැ'යි සැප්තැම්බර් 04 වෙනිදා 'ඩේලි නිවුස්' පත්‍රයට නාවුක හමුදාපතිවරයා කළ ප්‍රකාශයෙහි ගැබ්වන ඇත්ත ඒ ගෝලීය යථාර්ථයට අදාළ එකකි. අවසාන වශයෙන් විමසා බැලිය යුත්තේ එයයි.

**(මතු සම්බන්ධයි)**


**රවීසා**

*raveesa@googlemail.com*



*රාවය / 2008 සැප්තැම්බර් 21*